වාවකච්චේරිය ප්‍රාදේශිය සභාව

යාපනය දිස්ත්‍රික්කය.

------------------------------------------

1. මූල්‍ය ප්‍රකාශන

----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරිම.

-----------------------------

සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2013 මැයි 22 දින විගණනයට ඉදිරිපත් කර තිබුණු අතර ඉකුත් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2012 අප්‍රේල් 10 දින ඉදිරිපත් කර තිබුණි. සමාලෝචිත වර්ෂය සඳහා වූ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2013 සැප්තැම්බර් 02 දින සභාවේ සභාපතිවරයා වෙත නිකුත් කර ඇත.

1.2 මතය

-------

මාගේ පරික්ෂණයෙන් පෙනීයන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු හා පැහැදිලි කිරිම් අනුව වාවකච්චේරිය ප්‍රාදේශිය සභාව 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත් මාගේ වාර්තාවේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශන වලට වන බලපෑම හැර 2012 දෙසැම්බර් 31 දිනට වාවකච්චේරිය ප්‍රාදේශිය සභාවේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතු වල මූල්‍ය ප්‍රතිඵල හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව මූල්‍ය ප්රකාශ පිළියෙල කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්විම්

---------------------------------------------

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

---------------------

(අ) වත්කම්, ආදායම් සහ වියදම් සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශයන්හි නිරික්ෂණය වූ ගිණුම්කරණ අඩුපාඩු පහත වගුවෙහි දැක්වේ.

| මූල්‍ය ප්‍රකාශයන් කෙරෙහි බලපෑම | වත්කම් | | ආදායම් | | වියදම් | | වගකීම් | |
|---|---|---|---|---|---|---|---|---|
| | අවස්ථා සංඛ්‍යාව | වටිනාකම රු. | අවස්ථා සංඛ්‍යාව | වටිනාකම රු. | අවස්ථා සංඛ්‍යාව | වටිනාකම රු. | අවස්ථා සංඛ්‍යාව | වටිනාකම රු. |
| අඩුවෙන් දැක්වීම් | - | - | - | - | - | - | 01 | 311,154 |
| වැඩියෙන් දැක්වීම් | 01 | 49,031 | 02 | 1,206,464 | 01 | 63,425 | - | - |
| සාවද්‍ය වර්ගීකරණය | 01 | 349,720 | - | | 01 | 4,200 | - | - |

(ආ) සභාවට අයත් ගොඩනැගිලි අගය කර මූල්‍ය ප්‍රකාශයනිහි අනාවරණය කර නොතිබුණි.

1.3.2 විගණනය සඳහා සාක්ෂි නොමැති වීම

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.15,831,108 ක් වූ ගනුදෙනු විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය.

2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශයන් අනුව 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ ආදායම ඉක්මවූ පුනරාවර්තන වියදම රු.3,139,405 ක් වූ අතර එයට එරෙහිව ඉකුත් වර්ෂය සඳහා පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම් අතිරික්තය රු.6,265,204 ක් විය.

2.2 මූල්‍ය පාලනය

අයවැය ඇස්තමේන්තු නිසි පරිදි පිළියෙල කර නොතිබුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන් අයවැයගත ආදායම් සහ තථ්‍ය ආදායම් අතර රු.5,096,126 ක වෙනසක් සහ අයවැයගත වියදම් සහ තථ්‍ය වියදම් අතර රු.10,958,921 ක වෙනසක් ද විගණනයේදී නිරීක්ෂණය විය.

2.3 ආදායම් පරිපාලනය

------------------------

2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් සහ හිඟ ආදායම්

-------------------------------------------------------------------

සමාලෝචිත වර්ෂයට අදාළව සභාපතිවරයා විසින් ඉදිරිපත් කරන ලද ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් සහ හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දින සමුච්චිත හිඟ |
|---|---|---|---|
| | රු.000 | රු.000 | රු.000 |
| වරිපනම් සහ බදු | 120 | 74 | 1,013 |
| බදු කුලි | 9,005 | 9,672 | 75 |
| බලපත්‍ර ගාස්තු | 1,405 | 1,644 | 18 |
| වෙනත් ආදායම් | 34,054 | 28,098 | - |

2.3.2 හිඟ ආදායම්

----------------

සමාලෝචිත වර්ෂය තුල අයකළ යුතු රු.1,105,559 ක් වූ හිඟ තක්සේරු බදු අක්කර බදු, වරිපනම්, කුලී සහ බදුකුලී 2012 දෙසැම්බර් 31 දකිවා අයකර නොතිබුණි.

2.3.3 ආදායම් රැස්කිරීම් අඩුවීම

------------------------------

(අ) තක්සේරු බදු අයකිරීම සඳහා වත්කම් ප්‍රත්‍යාගණනය වර්ෂ 18 ක් පුරා සිදුකර නොතිබුණි. තවද සරසාලෙයි, කච්චායි, වරානි සහ මිරුසුවිල් උප කාර්යාල වල තක්සේරු බදු ප්‍රත්‍යාගණනය නිමකර නොමැති වීම නිසා ආදායම් අඩුවී තිබුණි.

(ආ) දේපළ නාම වෙනස් කිරීම වර්ෂ 18 ක් පුරා සභාපතිවරයා විසින් ඔහුගේ අභිමතය පරිදි සිදුකර තිබුණු අතර ඒ සඳහා තක්සේරු දෙපාර්තමේන්තුවෙන් අනුමැතිය ලබාගෙන නොතිබුණි.

(ඇ) වරිපනම් ගණනය කිරීමෙන් පසු නිසි අයකර ගැනීමේ පරිපාටිය අනුගමනය කර නොතිබුණි.

2.3.4 ආදායම් අහිමි විම

------------------------

විදුලි බලය සැපයීම 1999 වර්ෂයේ සිට ලංකා විදුලිබල මණ්ඩලයට භාරදී තිබුණ නමුත් සභා බල ප්‍රදේශය තුල වීදි ලාස්පු නඩත්තු කිරිම වෙනුවෙන් පළාත් පාලන කොමසාරිස්වරයාගෙන් ලැබියු යුතු රු.502,922 ක මුදලක් ප්‍රතිපූර්ණය කර නොතිබුණි. ඒ හේතුවෙන් සභාවට පාඩු විදීමට සිදු වි තිබුණි.

2.3.5 උසාවි දඩ

-----------

විවිධ ආඥා පණත් යටතේ පනවන ලදුව මහේස්ත්‍රාත් උසාවි වෙතින් ලැබිය යුතු උසාවි දඩ රු.249,133 ක් සමාලෝචිත වර්ෂය තුල ලැබී නොතිබුණු අතර එම මුදල් ආදායම් සහ ලැබිය යුතු මුදල් ලෙස බිල්කර තිබුණි.

2.3.6 මුද්දර ගාස්තු

----------------

අයවැය ලේඛණයෙහි සමාලෝචිත වර්ෂය සඳහා ඇස්තමේන්තුගත ආදායම රු.2,500,000 ක් ලෙස දක්වා තිබුණ ද, ඉඩම් රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාගෙන් මුද්දර ගාස්තු අයකිරිම් පිළිබඳ විස්තර ලබා ගැනිමට කටයුතු කර නොතිබුණි.

2.4 වත්කම් කළමනාකරණය

--------------------------------

2.4.1 අයකරගතයුතු කාර්යය මණ්ඩල ණය

-------------------------------------

ඉල්ලා අස්වු සහ තනතුරු හැර ගිය නිලධාරින්ගේ රු.10,819 ක් වු කාර්ය මණ්ඩල ණය වර්ෂ 05 කට අධික කාලයක් අය නොවී පැවති අතර මෙම මුදල ඇප කරුවන්ගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

2.5 නීති, රීති, රෙගුලාසි ආදියට අනුකූල නොවිම

-----------------------------------------------------

පහත සඳහන් නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණයන්හි විධිවිධානයන්ට අනුකූල නොවීම් විගණනයේදි නිරික්ෂණය විය.

| | | | |
|---|---|---|---|
| | නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණයන්ට යොමුව. | | අනුකූල නොවීම් |
| | ---------------------------------------------- | | ---------------------- |
| (අ) | ප්‍රාදේශීය සභා ( මූල්‍ය සහ පරිපාලන) රීති - 1988 | | |
| (i) | III පරිච්ඡේදයේ 66 වගන්තිය | - | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 150(4) වගන්තිය ප්‍රකාරව හිඟ බදු අයකර ගැනීම සඳහා ලේකම්වරයා කටයුතු කර නොතිබුණි. |
| (ii) | VIII පරිච්ඡේදයේ 02 වගන්තියේ 151 උප වගන්තිය | - | එකතු කරනු ලබන සියළුම මුදල් තැන්පත් කර ප්‍රදේශීය සභා අරමුදලට බැර කළ යුතුය. නමුත් දෛනික එකතු කිරීම් රු.29,155 ක් එකතු කිරීම් ලේඛණයේ සටහන් කර නොතිබුණි. 2012 දෙසැම්බර් 03 සිට 2012 දෙසැම්බර් 05 දක්වා වූ දෛනික එකතු කිරීම් 2012 දෙසැම්බර් 07 දක්වා එකතු කිරීම් ලේඛනයේ සටහන් කර නොතිබුණි. |
| (ආ) | මුදල් කොමිෂ සභාවේ ලේකම්ගේ අංක 2/2006 හා 2006 මාර්තු 07 දිනැති චක්‍රලේඛය | - | ඵලකයක් සඳහා වැය කළ හැකි උපරිම මුදල රු.12,500 ක් වුවත් සභාව ඵලකයක් සෑදිම සඳහා රු.15,000 ක් වැයකර තිබුණි. |
| (ඇ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 132(අ) වගන්තිය | - | සත්කාරයන් සඳහා රු.1000 කට වැඩි වියදමක් දැරීම සඳහා පූර්ව අනුමැතිය ලබාගත යුතු වුවද, එසේ පූර්ව අනුමැතිය ලබා නොගෙන සභාව සත්කාර කටයුතු සඳහා රු.48,588 ක් වැයකර තිබුණි. |

| | | |
|---|---|---|
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි මු.රෙ. 571 - | වර්ෂ 05 කට වැඩි රු.557,352 ක් වූ තැන්පතු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |

2.6 ආර්ථික නොවූ වියදම්

එලකයක් සෑදීම සහ නාම පුවරුවක් සවි කිරිම සඳහා රු.92,710 ක වියදමක් දරා තිබුණු අතර එය සභා අරමුදල් අනාර්ථික ලෙස භාවිතා කිරිමක් ලෙස සැලකේ.

2.7 ව්‍යාපෘති ක්‍රියාත්මක කිරිමේ ප්‍රමාදය

පහත සඳහන් නිරික්ෂණයන් කරනු ලැබේ.

(අ) වර්ෂය ආරම්භයේදි වෙනුවට වර්ෂය අවසානයේදි සභාවේ ප්‍රාග්ධන වැඩ අරඹා තිබුණු බැවින් ප්‍රාග්ධන වැඩ ගණනාවක් මුදල් වර්ෂය තුලදි නිමකර නොතිබුණි. විස්තර පහත දැක්වේ.

| ව්‍යාපෘති විස්තර | ඇස්තමේන්තු කළ පිරිවැය | ගිවිසුම් දිනය | නිමකිරිමට නියමිත දිනය | නිම නොකිරිමට හේතු |
|---|---|---|---|---|
| කාන්ති ප්‍රජා මධ්‍යස්ථානය අළුත්වැඩියාව | 100,000 | 2012.12.01 | 2012.12.31 | අයහපත් කාලගුණය |
| මුරුගන් කෝවිල මාර්ගය අළුත්වැඩියාව | 60,000 | 2012.11.01 | 2013.01.01 | අයහපත් කාලගුණය |
| කයිතඩි ළමා උද්‍යානයේ වැට | 250,000 | 2012.08.27 | 2012.10.27 | අයහපත් කාලගුණය |
| ඔඩ්ඩුවැලි මාර්ගය අළුත්වැඩියාව | 200,000 | 2012.12.20 | 2012.12.31 | අයහපත් කාලගුණය |
| කොළනි පොදු ළිඳ | 50,000 | 2012.12.20 | 2013.02.20 | අයහපත් කාලගුණය |

(ආ) අයවැය ලේඛනයෙහි අනුමැතියක් නොමැතිව සමාලෝචිත වර්ෂයේදි සභා අරමුදල් වලින් රු.100,000 ක් වටිනා ප්‍රාග්ධන වැඩ 02 ක් සභාව විසින් නිමකර තිබුණි.

(ඇ) කොඩිකාමම් වෙළඳ පොළෙහි වැසිකිළි ඉදිකිරිමේ ව්‍යාපෘතිය සඳහා අයවැය ලේඛනය මගින් රු.1,500,000 ක් අනුමත කර තිබුණි. කෙසේ වුවද ප්‍රදේශයේ ජීවත්වන ජනතාවගේ අවශ්‍යතා නොසලකා හරිමින් ව්‍යාපෘතිය අත්හැර දමා තිබුණි. නමුත් ව්‍යාපෘතිය සම්පූර්ණ කිරිම කෙරෙහි අවධානය යොමු නොකොට රු.8,240,000 ක් වූ ආදායම් එකතු කිරිම් පොලී ඉපැයීමේ අරමුණින් ජාතික ඉතිරිකිරිමේ බැංකුවේ ස්ථාවර තැන්පතුවල ආයෝජනය කර තිබුණි.

2.8 <u>මෙහෙයුම් අකාර්යක්ෂමතා</u>

වැසිකිළි ඉදිකිරිම සහ මෙහෙයුම් සංවර්ධන කටයුතු සඳහා පළාත් පාලන කොමසාරිස්වරයාගෙන් 2006-2012 කාලපරිච්ඡේදය තුළ ලද රු.1,158,151 ක් වූ පරිත්‍යාග අපේක්ෂිත කාර්යයන්සඳහා යොදා නොගෙන තැන්පතු ගිනුමෙහි රඳවාගෙන තිබුණි.

2.9 <u>ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය</u>

ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතිය සඳහා ලැබුණු රු.200,000 ක් වූ මුදලක් ව්‍යාපෘතිය ක්‍රියාත්මක නොකොට විවිධ ණයහිමියෝ ගිණුමෙහි රඳවාගෙන තිබුණි. එබැවින් 1987 අංක 15 දරන ප්‍රාදේශිය සභා පනතේ 3 වගන්තිය ප්‍රකාරව ප්‍රදේශයේ ජීවත් වන ජනතාවට පහසුකම් සැපයීමට සභාව අපොහොසත් වි තිබුණි.

2.10 <u>අභ්‍යන්තර විගණනය</u>

සභාව විසින් ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

3. <u>පද්ධති සහ පාලන</u>

පහත සඳහන් පද්ධති සහ පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

(අ) ආදායම් රැස්කිරිම

(ආ) ස්ථාවර වත්කම්

(ඇ) ගිණුම්කරණය

(ඈ) පරිත්‍යාග

(ඉ) මානව සම්පත්

(ඊ) වාහන උපයෝජනය

(උ) විවිධ තැන්පතු

(ඌ) අයවැය පාලනය